# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2337/19 - 2023 ජූනි මස 23 වැනි සිකුරාදා - 2023.06.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 11/1980 (40)

**1980 අංක 26 දරන ආහාර පනත**

1980 අංක 26 දරන ආහාර පනතේ 32 වන වගන්තිය යටතේ ආහාර උපදේශක කමිටුව විමසා සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

,
සෞඛ්‍ය අමාත්‍ය.

2023 ජූනි මස 12 වැනි දින.
කොළඹ දී ය.

නියෝග

2006 අගෝස්තු මස 03 වන දින අංක 1456/22 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2006 ආහාර (ජාන වෙනස් කළ ආහාර ආනයනය, ලේබල් කිරීම හා විකිණීම පාලනය කිරීමේ) නියෝග, එහි 13 වන නියෝගය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"13. ආහාරයක ජාන වෙනස් කළ ජීවීන් හෝ ද්‍රව්‍ය සියයට බින්දුවයි දශම නවයකට (0.9%) වඩා අඩුවෙන් අඩංගුව හෝ ඇතුළත්ව ඇත්නම් මේ නියෝගවල විධිවිධාන අදාළ වීමෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

එසේ වුව ද, ජාන වෙනස් කළ ජීවීන් හෝ ද්‍රව්‍ය අඩංගුවීම තාක්ෂණිකව වැළැක්විය නොහැකි ලෙස සලකන විට එම ජීවීන් හෝ ද්‍රව්‍ය විද්‍යාත්මක අවදානම් තක්සේරුවකට භාජනය කිරීමෙන් පසු හානි නොවන ලෙස සලකනු ලැබිය යුතු ය."

EOG 06 - 0169


1A - PG 6365 — 3506 (2023/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*